# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.06.29 පැය 1145 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1072 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොසොන් මහා පෙරහර හේතුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම - දික්වැල්ල පොලිස් වසම.**

2026.06.29 දින දික්වැල්ල පොලිස් වසමේ මිණිකිරුළ රජමහා විහාරස්ථානය, රත්නාවල තපෝධනාරාම විහාරස්ථානය, කෝන්දෙණිය අශෝකාරාම විහාරස්ථානයේ හා 2026.07.01 දින වලස්ගල ශ්‍රී ජයවර්ධන මුවලින්දාරාම විහාරස්ථානයේ පොසොන් මහා පෙරහර වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

- **මිණිකිරුළ රජමහා විහාරයේ පෙරහර 2026.06.29 දින දහවල් 12.00 සිට වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.**

  පෙරහර විහාරස්ථානයෙන් ආරම්භ කර කොළඹ කතරගම ප්‍රධාන මාර්ගයේ තංගල්ල දෙසට ගමන් කර කෙමගොඩ හන්දියෙන් නිල්වැල්ල දෙසට ගමන් කර නිල්වැල්ල ධීවර වරාය පසු කර දොඩම්පහල හන්දියට පැමිණ නැවත කොළඹ කතරගම ප්‍රධාන මාර්ගයට පිවිස තංගල්ල දෙසට ගමන් කර නැවත විහාරස්ථානයට පැමිණීමට නියමිතව ඇත.

  **පෙරහර දොඩම්පහල හන්දියේ සිට කෙමගොඩ හන්දිය දක්වා ගමන් ගන්නා කාලසීමාව තුල කොළඹ - කතරගම ප්‍රධාන මාර්ගයේ එක් කොටසක් වසා තැබීම සිදුවන බැවින් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස රියැදුරන්ගෙන් ඉල්ලා සිටී.**

  - තංගල්ල සිට බෙලිඅත්තට පිවිස දික්වැල්ල දක්වාත්, බෙලිඅත්තෙන් අධිවේගී මාර්ගයත්, මහවෙල මාර්ගයේ පහජ්ජාව හන්දියෙන් හදපාන්ගොඩැල්ල දෙසට ගමන් කර දික්වැල්ල දෙසටත්, වලස්ගලින් රදම්පල දෙසටත්, දික්වැල්ල වෙහැල්ල රත්මලේ හරහා මාතර දෙසටත් ගමන් කල හැකිය.

- **රන්නාවල තපෝධනාරාම විහාරයේ පෙරහර 2026.06.29 වන දින දහවල් 1230 ට විථි සංචාරය කිරීමට නියමිතව ඇත.**

  පෙරහර විහාරස්ථානයෙන් ආරම්භ කර කිරිනැලිය හන්දියට පිවිස රත්මලේ ප්‍රධාන මාර්ගයේ දික්වැල්ල දෙසට ගමන් කර වේලුවනාරාම පාර ඔස්සේ රදම්පල දෙසට නාවරහේන හන්දිය දක්වා ගමන් කර රදම්පල නගරයට පිවිස රදම්පල රෝහල අසලින් රන්නාවල මාර්ගයේ නැවත විහාරස්ථානයට පැමිණීමට නියමිතව ඇත.

  **පෙරහර ගමන් ගන්නා කාලසීමාව තුල පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස රියැදුරන්ගෙන් ඉල්ලා සිටී.**

  - රත්මලේ නගරයේ සිට හුන්නදෙණිය හන්දියට පැමිණ දික්වැල්ල දෙසටත්, මාතර දෙසටත් ගමන් කල හැකි අතර, රදම්ල මුරුගස්පිටිය හන්දියෙන් තිහගොඩ දෙසට ද, නාවරහේන හන්දියෙන් ගලගම හන්දියට පැමිණ බෙලි අත්ත දෙසටද ගමන් කල හැකිය.

- **කෝන්දෙණිය අශෝකාරාම විහාරස්ථානයේ පොසොන් පෙරහර 2026.06.29 වන දින රාත්‍රී 07.00 ට වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.**

  පෙරහර විහාරස්ථානයෙන් ආරම්භ කර කොන්දෙණිය හන්දියෙන් පරණ බෙලිඅත්ත මාර්ගයට පිවිස ප්‍රධාන මාර්ගය ඔස්සේ දික්වැල්ල නගරයට ගමන් කර කොළඹ - කතරගම ප්‍රධාන මාර්ගයේ දික්වැල්ල සිට තංගල්ල දෙසට ගමන් කර අශෝකාරාම මාර්ගයෙන් විහාරස්ථානයට පැමිණීමට නියමිතව ඇත.

  **පෙරහර පරණ බෙලිඅත්ත මාර්ගයේ විජිත මහා විද්‍යාලය දක්වා ගමන් ගන්නා කාලසීමාව තුල කොළඹ - කතරගම ප්‍රධාන මාර්ගයේ එක් කොටසක් වසා තැබීමට සිදුවන බැවින් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස රියැදුරන්ගෙන් ඉල්ලා සිටී.**

  - තංගල්ල සිට බෙලිඅත්තට පිවිස දික්වැල්ල දක්වාත්, බෙලිඅත්තෙන් අධිවේගී මාර්ගයත්, මහවෙල මාර්ගයේ පහජ්ජාව හන්දියෙන් හඳපාන්ගොඩැල්ල දෙසට ගමන් කර දික්වැල්ල දෙසටත්, වලස්ගලින් රදම්පල දෙසටත්, දික්වැල්ල වෛහැල්ල රත්මලේ හරහා මාතර දෙසටත් ගමන් කල හැකිය

- **වලස්ගල ශ්‍රී ජයවර්ධන මුචලින්දාරාමය විහාරස්ථානයේ පොසොන් පෙරහර 2026.07.01 දින උදෑසන 10.00 සිට වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.**

  පෙරහර විහාරස්ථානයෙන් ආරම්භ වී වලස්ගල සිට බෙලිඅත්ත දෙසට ගමන් කර කුමාරතුංග මාර්ගයේ උතුර විද්‍යාලය අසලින් ප්‍රධාන මාර්ගයට පිවිස මුස්ලිම්වීදිය ඔස්සේ පරණ බෙලි අත්ත මාර්ගයේ පරණ බෙලිඅත්ත හන්දියට පැමිණ දික්වැල්ල බස් නැවතුම්පොල හා පොලිස් ස්ථානය පසු කර, නව බෙලිඅත්ත මාර්ගයේ නැවත විහාරස්ථානයට පැමිණීමට නියමිතව ඇත.

  **පෙරහර ගමන් ගන්නා කාලසීමාව තුල පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස රියැදුරන්ගෙන් ඉල්ලා සිටී.**

  - තංගල්ල සිට බෙලිඅත්ත අධිවේගී මාර්ගයත්, රදම්පලින් නාවරහේන හන්දියේ සිට ගලගම හන්දියට පිවිස බෙලිඅත්ත දෙසටත්, හුන්නදෙණිය හන්දියේ සිට රත්මලේ දෙසට ගමන් කර මුරුතගස්පිටිය හන්දියෙන් තිහගොඩ දෙසටත්, නාකුළුගමුව හන්දියේ සිට පහජ්ජා හන්දියට පිවිස තංගල්ල දෙසටත්, දඹගස්ආර හන්දියෙන් සියඹලාගස් හන්දිය හරහා තංගල්ල දෙසටත් ගමන් කල හැකිය

ඉහත නිවේදනය රියැදුරන්ගේ හා මහජනතාවගේ දැනගැනීම සඳහා ඔබ මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**